පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொலை தொடர் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
දෙසැම්බර් 2018
முதலாம் வருட கலைத்தேர்வு பரீட்சை (வெளிவாரி - புதிய பாடத்திட்டம்)
டிசம்பர் - 2018
1st YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS (EXTERNAL - NEW SYLLABUS) DECEMBER 2018

## SUPE -011
## තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය

පළමු කොටසෙන් අඩුම තරමේ ප්‍රශ්න දෙකක් ද, දෙවන කොටසෙන් ප්‍රශ්න එකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) කට පමණක් පිළිතුරු සපයන්න.

කාලය: පැය (03) තුනයි.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 10කි.

---

### I කොටස

(01) පහත දැක්වෙන තර්ක ඔබගේ සංක්ෂේපණ රටාව ලියා දක්වමින් සංකේතකරණය කොට ඒවායෙහි සප්‍රමාණ බව ව්‍යුත්පන්න ක්‍රමයෙන් දක්වන්න.

(i) ඩේවිඩ් දාර්ශනිකයෙක් නම් පමණක් ඔහු බ්‍රිතාන්‍ය වැසියෙක් වේ යන සමස්ත ප්‍රකාශනය අසත්‍ය වේ. ඩේවිඩ් දාර්ශනිකයෙකි. එමනිසා ඔහු බ්‍රිතාන්‍ය වැසියෙකි.

(ii) ඔහු නුවර යන අතර ඇය කොළඹ යන්නීය. මව කොළඹ යන්නී නම් එවිට ඇය කොළඹ නොයන්නීය. එක්කෝ මව කොළඹ යන්නීය නැතිනම් පියා කොළඹ සිට එන්නේය. එමනිසා ඔහු නුවර යන අතර පියා කොළඹ සිට එයි.

(iii) එක්කෝ හේගල් නැත්නම් ප්ලේටෝ විඥානවාදියෙකු වන්නේ නම් එවිට මාර්ක්ස් භෞතිකවාදියෙකු වේ. එංගල්ස් කිතුණුවෙක් නම් මාර්ක්ස් භෞතිකවාදියෙකු නොවේ. එමනිසා ප්ලේටෝ විඥානවාදියෙකු වේ නම් එවිට එංගල්ස් කිතුණුවෙක් නොවේ.

(iv) ශ්‍රී ලංකාව හා ඉන්දියාව යන කණ්ඩායම් දෙකම දුර්වල නම් එවිට එංගලන්තය තරඟය දිනනු ඇත. එමනිසා එංගලන්තය තරඟය දිනන්නේ නැතිනම් එක්කෝ ශ්‍රී ලංකා කණ්ඩායම දුර්වල නැත නැත්නම් ඉන්දීය කණ්ඩායම දුර්වල නැත.

(සෑම කොටසකටම ලකුණු 05 බැගිනි)

අ.පි.බ.

(02) පහත දැක්වෙන ප්‍රමේයයන් ව්‍යුත්පන්න ක්‍රමයෙන් සාධනය කරන්න.

(i) [(P V ~ P) V Q]

(ii) [(~ P V Q) ↔ (P → Q)]

(iii) [P → Q) ↔ ~(P ∧ N Q)]

(iv) [(P → Q) V (Q → R)]

(සෑම කොටසකටම ලකුණු 05 බැගිනි)

(03) ඔබගේ සංකේෂ්පණ රටාව ලියා දක්වමින් පහත දැක්වෙන තර්ක සංකේතකරණය කොට සත්‍ය වක්‍ර වක්‍ර ක්‍රමයෙන් ඒවායෙහි සප්‍රමාණතාවය විනිශ්චය කරන්න.

(අ) රාවණ පුරාවෘත්තයක් නම් එවිට රාමායණය ප්‍රබන්ධයක් වේ. රාවණ පුරාවෘත්තයක් නොවන අතර රාමායණය ප්‍රබන්ධයක්ද නොවේ. එමනිසා රාමා ශ්‍රී ලංකාව ආක්‍රමණය කළේය.

(ආ) සූර්යකේන්ද්‍රවාදය හා පෘථිවිකේන්ද්‍රවාදය යන දෙකම නිවැරදි විය නොහැකිය. සූර්යකේන්ද්‍රවාදය නිවැරදි නම් එවිට කොපර්නිකස් බුද්ධිමතෙක් වේ. සූර්යකේන්ද්‍රවාදය නිවැරදිය. එමනිසා ටොලමි නිවැරදි නැත.

(ඇ) අපගේ පරිසරයට අප ගෞරව කරන්නේ නම් අපට පරිසරය විනාශ කළ නොහැකිය. පරිසරය පූජනීය වේ. එමනිසා අපගේ පරිසරයට අපි ගෞරව කරමු.

(ඈ) ඔබ උඩ පනී නම් එවිට ඇය බිම වැටෙයි. ඇය බිම වැටෙයි නම් එවිට ඔබ උඩ යයි. එමනිසා ඔබ උඩ පනී නම් එවිට ඔබ උඩ යයි.

(සෑම කොටසකටම ලකුණු 05 බැගිනි)

(04) ඔබගේ සංකේෂ්පණ රටාව ලියා දක්වමින් පහත දැක්වෙන තර්ක සංකේතකරණය කොට ඒවායෙහි සප්‍රමාණතාවය වෙන් රූප ඇසුරෙන් විනිශ්චය කරන්න.

(i) සියලු ශ්‍රී ලාංකිකයෝ දක්ෂය. සියලු දක්ෂ අය බුද්ධිමත්ය. එබැවින් සියලු බුද්ධිමත් අය ශ්‍රී ලාංකිකයෝය.

(ii) කාර්ල් මාර්ක්ස් දාර්ශනිකයෙකි. ඇරිස්ටෝටල්ද දාර්ශනිකයෙකි. එමනිසා කාල්මාර්ක් හා ඇරිස්ටෝටල් යන දෙදෙනාම දාර්ශනකයෝය

(iii) ඇතැම් දේශපාලනඥයන් උගත්ය. සියලු උගත් අයට විනයක් ඇත. එමනිසා ඇතැම් දේශපාලනඥයින්ට විනයක් ඇත.

(iv) කිසිම දාර්ශනිකයෙක් විද්‍යාඥයෙක් නොවේ. නිව්ටන් විද්‍යාඥයෙකි. එමනිසා නිව්ටන් දාර්ශනිකයෙක් නොවේ.

(සෑම කොටසකටම ලකුණු 05 බැගිනි)

අ.පි.බ.

(05) පහත දැක්වෙන ඕනෑම **හතරකට** කෙටි සටහන් ලියන්න.

I. සරල වාක්‍ය
II. ප්‍රබල වියෝජකය
III. ඇරිස්ටෝටලියානු චින්තන නියම.
IV. විශ්ලේෂී හා සංශ්ලේෂී ප්‍රස්තුත.
V. වර්ග අනුපූරකය.
VI. වක්‍ර ව්‍යුත්පන්න ක්‍රමය.

(සෑම කොටසකටම ලකුණු 05 බැගින්)

## II කොටස

(06) පහත දැක්වෙන ඒවා අතර වෙනස පැහැදිලි කරන්න.

i. ස්වභාවික හා සාමාජීය විද්‍යා.
ii. ශුද්ධ හා ව්‍යවහාරික විද්‍යා.
iii. විද්‍යාව හා තාක්ෂණය.
iv. ආනුභූතික විද්‍යා හා ආනුභූතික නොවන විද්‍යා.

(සෑම කොටසකටම ලකුණු 05 බැගින්)

(07) (අ) "විද්‍යාත්මක ක්‍රමය" යන්න ඔබ වටහා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(ආ) පහත දැක්වෙන ඒවාට කෙටි සටහන් ලියන්න.

i. විධික්‍රමවේදියා හා විද්‍යාඥයා.
ii. විද්‍යාවේ වාස්තවිකත්වය පිළිබඳ සංකල්පය.
iii. සෝපන්‍යාසය නිගාමී ක්‍රමය.

(සෑම කොටසකටම ලකුණු 05 බැගින්)

(08) (අ) "සම්පරීක්ෂණ ක්‍රමය ස්වභාවික විද්‍යාවන්වල සිදු කෙරෙන පර්යේෂණවලට . පමණක් සීමාවේ". විමසන්න.

(ලකුණු 10 යි)

අ.පි.බ.

(ආ) පහත දැක්වෙන ඒවා ඔබගේ නිදසුන් ගෙන හැර දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

i. නිර්ණය පරීක්ෂණ.
ii. ස්වභාවික නිරීක්ෂණයෙහි සීමාවන්.

(සෑම කොටසකටම ලකුණු 05 බැගිනි)

(09) **<u>එක්කෝ</u>**

(අ) හොඳ විද්‍යාත්මක උපන්‍යාසයක් යනු කුමක්ද?

(ලකුණු 05 යි)

(ආ) විද්‍යාත්මක උපන්‍යාසයක් ගොඩනැගීමේදී සාමාන්‍යයෙන් විද්‍යාඥයෙකු අනුගමනය කරන පියවර නිදසුන් සහිතව පරීක්ෂා කරන්න.

(ලකුණු 15 යි)

**<u>නැත්තම්</u>**

(අ) සිද්ධියක සම්භාවිතාවය යනු කුමක්ද?

(ලකුණු 05 යි)

(ආ) ඕනෑම සිද්ධියක සම්භාවිතාවය බින්දුවත් එකත් අතර අගයක් ගනු ලබන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05යි)

(ඇ) සම්භාවිතාව පිළිබඳ සාම්ප්‍රදායික අර්ථකථනය හා එහි දුර්වලතා පරීක්ෂා කරන්න.

(ලකුණු 10 යි)

(10) පහත දැක්වෙන ඒවායින් **<u>ඕනෑම හතරකට</u>** කෙටි සටහන් ලියන්න.

i. විද්‍යාත්මක ව්‍යාඛ්‍යාන.
ii. වාද හා නියම.
iii. සත්ව අයිතිවාසිකම් හා විද්‍යාව.
iv. සාමාජීය විද්‍යාවන්හි සංඛ්‍යාණය භාවිතය.
v. විද්‍යාවෙහි සොයාගැනීමෙහි ක්‍රමය.
vi. ගැලීලියෝ.
vii. කොපර්නිකස්.

(සෑම කොටසකටම ලකුණු 05 බැගිනි)